(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 2(8).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2025 අගෝස්තු 07 බ්‍රහස්පතින්දා**

---

**2025 අගෝස්තු 19 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— රේගු ආඥා පනත යටතේ යෝජනා සම්මතය,— (235 අධිකාරය වූ) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු බදු සම්බන්ධයෙන් 2025.08.05 දින ඉදිරිපත් කරන ලද යෝජනා සම්මතය අනුමත කළ යුතු ය.

(2025 අප්‍රේල් 28 දිනැති අංක 2434/02 දරන අති විශේෂ ගැසට් පත්‍රය).

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2025 අප්‍රේල් 28 දිනැති අංක 2434/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.08.05 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— මුදල් පනත යටතේ නියෝගය,— 2018 අංක 35 දරන මුදල් පනතේ 51 වගන්තිය සමඟ කියවිය යුතු 19 වගන්තිය යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 අප්‍රේල් 28 දිනැති අංක 2434/05 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.08.05 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා,— ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ නියෝග,— 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 52(2) වගන්තිය සමඟ සහ 35(1), (2) සහ (4) වගන්ති සමඟ කියවිය යුතු 58 වගන්තිය යටතේ නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 අප්‍රේල් 01 දිනැති අංක 2430/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.08.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

**2025 අගෝස්තු 21 බ්‍රහස්පතින්දා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2025 සැප්තැම්බර් 09 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1105/2025

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරියට (RDA) ස්ථිර අධ්‍යක්ෂකවරුන් 39 දෙනෙකු පත් කිරීම සඳහා වර්තමාන රජය විසින් අදියරෙන් අදියර සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ බවත්;

(ii) එම සම්මුඛ පරීක්ෂණවලදී පළාත් අධ්‍යක්ෂකවරුන් 05ක් සහ අධ්‍යක්ෂකවරුන් 34 දෙනෙක් තෝරා ගෙන අධිකාරියේ සභාපතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමතිය සඳහා යොමු කර ඇති බවත්;

(iii) මාස හයක් පමණ ගතවී තිබුණද, මේ වනතෙක් එම පත්වීම් ලබාදී නොමැති බවත්;

(iv) එම අධිකාරියේ වර්ෂ ගණනාවක සිට සේවය කරන ලද සේවකයන්, විශ්‍රාම ගැන්වීමට ආසන්න කාලයේදී උසස් වීම් අපේක්ෂා කරන අතර එය සාධාරණ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මේ දක්වා ඉහත පත්වීම් ලබා නොදීමට හේතු කවරේද;

(ii) ඉහත පත්වීම් ලබා දීමට බාධා තිබේද;

(iii) එම බාධා කවරේද;

(iv) එම බාධා ඉවත් කිරීම සඳහා කටයුතු කරන්නේද;

(v) ඉහත පත්වීම් ලබා දීමේ ප්‍රමාදය, රජයේ කාර්යක්ෂමතාවයට අහිතකර ලෙස බලපාන බව දන්නේද;

(vi) ඉහත සඳහන් පත්වීම් ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1112/2025

ගරු රොෂාන් අක්මීමන මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ රජයේ පාසල්වල උග්‍ර ගුරු හිඟයක් පවතින බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම පළාතේ පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය සහ විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1118/2025

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සක්‍රිය සේවයේ යෙදී සිටිය යුතු වුවත්, ආබාධිත වීම හේතුවෙන් සක්‍රිය සේවයේ නොයෙදෙන හමුදා සාමාජිකයන් වෙනුවෙන් සිය ආබාධිත තත්ත්වය නිසාම ලබා දෙන සහන/දීමනා කවරේද;

(ii) එම ආබාධිත හමුදා සාමාජිකයන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන්වූ පසු මියගියහොත් ඔවුන්ගේ යැපෙන්නන්ට ලබා දෙන සහන/දීමනා කවරේද;

(iii) එම සහන/දීමනා ප්‍රමාණවත්ද;

(iv) නොඑසේ නම්, එම සහන/දීමනා ඉහළ නැංවීමට ක්‍රියා කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සක්‍රිය සේවයේ යෙදී සිටින ආබාධිත යුධ හමුදා සාමාජිකයන් විශ්‍රාම ගැන්වීමට පෙර මියගියහොත් ඔවුන්ගේ යැපෙන්නන්ට ලබා දෙන සහන/දීමනා කවරේද;

(ii) ආබාධිත වීම හේතුවෙන් සේවයට වාර්තා නොකරන ලද, පසුව සේවය අනවශ්‍ය යැයි යන පදනම මත සේවයෙන් ඉවත් කරන ලද යුධ හමුදා සාමාජිකයන්ට සිය ආබාධිත තත්ත්වය නිසා යම් සහනයක්/දීමනාවක් මේ වනවිට ලබා දෙන්නේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) ඔවුන්ට සහනයක්/දීමනාවක් ලබා දිය යුතු බව පිළිගන්නේද;

(v) එසේ නම්, ඒවා ලබා දීමට පියවර ගෙන තිබේද;

(vi) එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1158/2025

ගරු කිට්නන් සෙල්වරාජ් මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ, ඇල්ල ප්‍රාදේශීය සභාවට අයත්, කළුගල්ල වතුයායේ මුළු ඉඩම් ප්‍රමාණයෙන් අක්කර 53ක් වූ, තේ වගාව සහ අති සුඛෝපභෝගී බංගලාව සහිත ඉඩමේ අයිතිකරු ඉන්දියාවේ සිටින බවත්;

(ii) එම ඉඩම් සඳහා ව්‍යාජ අයිතිකරුවෙක් ඉදිරිපත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ඉඩමට බලහත්කාරයෙන් ඇතුළු වී තේ දළු නෙළීම නීති විරෝධී බව පිළිගන්නේද;

(ii) ඉහත ඉඩමේ අයිතිය නිරවුල් නොමැති බැවින් එම ඉඩම රජයට පවරා ගැනීමට කටයුතු කළ හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1175/2025

ගරු මංජුල සුගත් රත්නායක මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් පිළිවෙළින් 1997, 1999, 2002 සහ 2006 වර්ෂවල ක්‍රියාත්මක කරන ලද පුනස්ථාපන, දිගාමඩුලු ජන උදාන, නාමල් උයන හා දිසායුගම සහ ලෝක ජනාවාස දයාපුර යන නිවාස ව්‍යාපෘතිවල ඉඩම් පවරා ගෙන අදාළ ප්‍රතිලාභීන් වෙත ඔප්පු ලබාදී නොමැති බව දන්නේද;

(ii) ඒ අතරින් පුනස්ථාපන, දිගාමඩුලු ජන උදාන සහ ලෝක ජනාවාස යන නිවාස ව්‍යාපෘති සඳහා ඉඩම්ලාභීන් විසින් මුදල් එකතු කර, වට මැන, අදාළ වාර්තා අධිකාරිය වෙත යොමු කර ඇතත් මේ වනතෙක් ඉඩම් පවරා ගැනීමට අදාළ ඉල්ලීම් අම්පාර ප්‍රාදේශීය ලේකම් වෙත අමාත්‍යාංශය හරහා යොමු නොකිරීමට හේතු කවරේද;

(iii) එම ඉඩම් පවරා ගැනීමේ ඉල්ලීම අමාත්‍යාංශ ලේකම් හරහා අම්පාර ප්‍රාදේශීය ලේකම්ට යොමු කිරීමට ගත වන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත නිවාස ව්‍යාපෘතිවලට අමතරව අම්පාර දිස්ත්‍රික්කය තුළ මේ වනතෙක් ප්‍රතිලාභීන්ට ඔප්පු ලබාදී නොමැති නිවාස ව්‍යාපෘති තිබේද;

(ii) එසේ නම්, ඒවා කවරේද;

(iii) එම ඔප්පු ලබා දීම ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1178/2025

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ —

(i) ස්ථිර පදිංචි පවුල් සංඛ්‍යාව සහ ඔවුන්ට අයත් ඉඩම් ප්‍රමාණය;

(ii) පදිංචි, සින්නක්කර ඉඩම් ඔප්පු හිමි පවුල් සංඛ්‍යාව සහ පුද්ගලයන් සංඛ්‍යාව;

(iii) පදිංචි, ඉඩම් බලපත්‍ර හිමි පවුල් සංඛ්‍යාව සහ පුද්ගලයන් සංඛ්‍යාව;

(iv) පදිංචි, එහෙත් මේ වනවිටත් සින්නක්කර ඉඩම් ඔප්පු හෝ බලපත්‍ර නොමැති පවුල් සංඛ්‍යාව සහ පුද්ගලයින් සංඛ්‍යාව;

(v) ඇති, බලපත්‍ර සහිත කුඹුරු ඉඩම් සහ ගොඩ ඉඩම් ප්‍රමාණය;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ අවුරුදු 60කට අධික කාලයක් ජීවත්වන පුද්ගලයන්ට මේ වනතෙක් සින්නක්කර ඔප්පු ලබා නොදීමට හේතුව කවරේද;

(ii) සින්නක්කර ඔප්පු නොමැති වීම හේතුවෙන් බැංකු සහ මූල්‍ය ආයතනවලින් ණය හා උකස් සේවා ලබා නොදීමෙන් ඔවුන්ට තම ආර්ථිකය වර්ධනය කර ගැනීමට නොහැකිව සිටින බව දන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1234/2025

ගරු අරවින්ද සෙනරත් මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ රැකියා ලබා දෙන ආයතනවල නම් කවරේද;

(ii) නීත්‍යානුකූලව ගිවිසුම් ගතවූ ආයතන පමණක් විදේශ රැකියා ලබා දෙන්නේද;

(iii) නීත්‍යානුකූලව ගිවිසුම් ගත නොවූ ආයතන විදේශ රැකියා ලබා දෙන්නේ නම්, එම ආයතනවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදේශ රැකියා ලබා දීමේදී, නීත්‍යානුකූල නොවන ආකාරයට රැකියා ලබාදෙන ආයතන විසින් මුදල් වංචා සිදු කරන්නේද;

(ii) එසේ නම්, එම ආයතන විසින් වංචා කර ඇති මුදල කොපමණද;

(iii) මුදල් අය කර එහෙත් රැකියා ලබාදී නොමැති ආයතනවලට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1236/2025

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ, මුසලි ප්‍රාදේශීය සභාවට අයත්, වේප්පම්කුලම් සිට සිලාවතුරෙ දක්වා වූ අභ්‍යන්තර මාර්ගය 2010 වර්ෂයේදී එවකට නැවත පදිංචි කිරීමේ හා ආපදා සහන සේවා අමාත්‍යාංශය විසින් ප්‍රතිසංස්කරණය කරන ලද බව දන්නේද;

(ii) ඉහත මාර්ගයේ දුර කොපමණද;

(iii) එම මාර්ගය කුමන ගම්මානයක් ඔස්සේ දිවෙන්නේද;

(iv) එහි ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන ලද දිනය සහ අවසන් කරන ලද දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට අදාළව සමාගම සමඟ එළඹි ගිවිසුමේ පිටපතක් ඉදිරිපත් කරන්නේද;

(ii) ගිවිසුමට එළඹෙන අවස්ථාව වනවිට සමාගමේ හිමිකරුවන් කවුරුන්ද;

(iii) එම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සමාගමට වෙන් කරන ලද මුදල කොපමණද;

(iv) ඉහත මාර්ගය ප්‍රතිසංස්කරණය කර නොමැති බවත්, ඒ සඳහා වංචා සහගත ලෙස මුදල් ලබා ගෙන ඇති බවත් දන්නේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1241/2025

ගරු තිළිණ සමරකෝන් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉඩම්, වාර්ෂික හෝ දීර්ඝ කාලීන බදු පදනම මත ලබාදී තිබේද;

(ii) ඉපලෝගම සහ කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ඉඩම්, සංවර්ධනය කිරීමට බදු පදනම මත ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම ඉඩම් ප්‍රමාණය සහ ඒවා ලබාදී ඇති කාල සීමාවන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අංක 519-ඉහලකාගම, අංක 621-ඉහලගම සහ අංක 618-කරඹවත්ත යන ග්‍රාම නිලධාරි වසම්වල බදු පදනම මත ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා බදු ගිවිසුම් අත්සන් කර තිබේද;

(iii) එසේ නම්, අදාළ පාර්ශ්වයන් කවරේද;

(iv) එම එක් එක් ඉඩමේ විශාලත්වය සහ බදු කාල සීමාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම ඉඩම් සංවර්ධනය කර තිබේද;

(vi) සංවර්ධනය නොකරන ලද ඉඩම් නැවත පවරා ගෙන තිබේද;

(vii) ඉහත ඉඩම් අතුරු බදු ලබාදී තිබේද;

(viii) ඉහත ඉඩම් වටා අලිවැට ඉදිකර ඇති බව දන්නේද;

(ix) ඒ සඳහා අවසර ලබා ගෙන තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1250/2025

ගරු නන්ද බණ්ඩාර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෑගල්ල දිස්ත්‍රික්කයේ ඇති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(ii) එම ඉඩම් අතරින් මේ වනවිට කර්මාන්ත සඳහා ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම එක් එක් ඉඩම ලබාදී ඇති පුද්ගලයාගේ නම සහ ලබාදී ඇති වර්ෂය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත (i)හි සඳහන් ඉඩම් අතරින් මේ දක්වා කිසිදු සංවර්ධන කටයුත්තකට භාවිතා කර නොමැති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(v) ඉහත (i)හි සඳහන් ඉඩම් අතරින් විකල්ප ඉඩම් බෙදාදී තිබේද;

(vi) එම විකල්ප ඉඩම් ලබා ගත් පුද්ගලයන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 සැප්තැම්බර් 10 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

15/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ සමස්ත තේ නිෂ්පාදනයට කුඩා තේ වතු හිමියන් ලබා දුන් දායකත්වය ප්‍රතිශතයක් ලෙස එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට මුළු කුඩා තේ වතු හිමියන් සංඛ්‍යාව කොපමණද;

(iii) කුඩා තේ වතු හිමියන් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

(v) කුඩා තේ වතු හිමියන්ගේ ජීවන මට්ටම උසස් කිරීම වෙනුවෙන් ඉහත සඳහන් එක් එක් ආයතනය විසින් සිදු කරනු ලබන කාර්යභාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

117/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරුන්ගේ නම් කවරේද;

(ii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා මේ වනවිට ගෙවනු ලබන වැටුප් හා දීමනා කවරේද;

(iii) වැටුප් හා දීමනා නොගන්නා මන්ත්‍රීවරුන්ගේ නම් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1253/2025

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ ඇති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(ii) එම ඉඩම් අතරින් මේ වනවිට බෙදාදී ඇති විකල්ප ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(iii) එම විකල්ප ඉඩම් ලබාදී ඇති එක් එක් පුද්ගලයාගේ නම, ලබා දුන් ඉඩම් ප්‍රමාණය, ඉඩම් ලබා දීමේ පදනම සහ ඉඩම් ලබා දුන් කාල වකවානු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම විකල්ප ඉඩම් ලබා දුන් පුද්ගලයන්ගේ නාම ලේඛනයේ දේශපාලඥයන්ගේ නම් සඳහන්ව තිබේද;

(v) එසේ නම්, එම දේශපාලඥයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1254/2025

ගරු ඊ. එම්. බස්නායක මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ස්ථාපිත කරන අවස්ථාවේදී, එම කොමිෂන් සභාවට අත්පත් කරගන්නා ලද මහනුවර දිස්ත්‍රික්කයේ ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(ii) එම ඉඩම් අතරින් නීත්‍යානුකූලව ඉඩම් බදුදී ඇති පුද්ගලයන් හා සමාගම්වල නම් සහ බදුදී ඇති ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පුද්ගලයන්ගෙන් සහ සමාගම්වලින් නියමිත පරිදි බදු අය කරන්නේද;

(iv) ඉහත (i)හි සඳහන් ඉඩම් අතරින් නීත්‍යානුකූල නොවන ආකාරයට ඉඩම් පරිහරණය කරන පුද්ගලයන් හා සමාගම්වල නම් කවරේද;

(v) එම පුද්ගලයන්ට/සමාගම්වලට එරෙහිව නීතිමය පියවර ගෙන තිබේ නම්, එහි වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1255/2025

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාගරික සංවර්ධන අධිකාරිය විසින් ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති අතරින් මේ වනවිට වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ව්‍යාපෘතියේ නම, ක්‍රියාත්මක කරන ලද ග්‍රාම නිලධාරි වසම, ආරම්භ කරන ලද වර්ෂය, අවසන් කරන ලද වර්ෂය, වියදම් කරන ලද මුදල සහ වර්තමාන තත්ත්වය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) නාගරික සංවර්ධන අධිකාරිය විසින් ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති අතරින් මේ වනවිට වැඩ අවසන් කර නොමැති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් ව්‍යාපෘතියේ නම, වියදම් කරන ලද මුදල සහ වර්තමාන තත්ත්වය වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉහත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 සැප්තැම්බර් 11 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

196/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රය තුළ සිදුකර ඇති ඉන්දියානු ආයෝජන ව්‍යාපෘති සංඛ්‍යාව, එම එක් එක් ආයෝජන ව්‍යාපෘතියේ නම, ආයෝජනයේ වටිනාකම සහ එමඟින් ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රයට ලැබෙන දායකත්වය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රයේ කර ඇති ඉන්දියානු ආයෝජන සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

219/2024

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 වර්ෂයේ නොවැම්බර් මාසයේ ශ්‍රී ලංකාවේ පැවති අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් විනාශ වූ කුඹුරු ප්‍රමාණය එක් එක් දිස්ත්‍රික්කය අනුව අක්කරවලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ හේතුවෙන් අපේක්ෂිත වී අස්වැන්නේ සිදු වන අඩු වීම කොපමණද;

(iii) විනාශ වූ කුඹුරු අතරින් නැවත වගා කරන ලද ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(iv) විනාශ වූ කුඹුරු සඳහා වන්දි ලබාදී තිබේද;

(v) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

226/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සොරාගත් වත්කම් නැවත අයකර ගැනීම සම්බන්ධයෙන් මත් ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC) සහ ස්ටාර් ආයතනය (StAR Initiative) යන ආයතනවල සහය ලබා ගැනීමට 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් පොරොන්දුවී තිබේද;

(ii) එම ආයතන මඟින් තාක්ෂණික සහ උපදේශන සේවා ලබා ගැනීමේ ප්‍රගතිය එක් එක් ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත ආයතන මඟින් තාක්ෂණික සහ උපදේශන සේවාවන් ලබා ගැනීමේ ප්‍රගතියක් නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

263/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන කවරේද;

(iii) මේ වනවිට එම දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම දෙපාර්තමේන්තුවේ වර්තමාන කාර්යභාරය කවරේද;

(v) එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නම කවරේද;

(vi) ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

313/2024

ගරු රවී කරුණානායක මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක පෞද්ගලික විදුලි ජනන සමාගම් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් සමාගමේ නම හා ලිපිනය සහ ජනන ධාරිතාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2015 වර්ෂයේ සිට මේ දක්වා ඉහත සඳහන් එක් එක් සමාගම ලංකා විදුලිබල මණ්ඩලය වෙත සැපයූ විදුලි ඒකක සංඛ්‍යාව සහ ඒ සඳහා එක් එක් සමාගමට ගෙවන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලි ජනන ධාරිතාව වැඩි කිරීම සඳහා ගැනීමට නියමිත ක්‍රියාමාර්ග කවරේද;

(v) එම විදුලි ජනනය සඳහා යොදා ගනු ලබන බලශක්ති ක්‍රමවේද පුනර්ජනනීය බලශක්තියද නැතහොත් තාප බල ශක්තියද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

340/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, පෝරතිව්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පෙරිය පෝරතිව් සහ පලුකාමම් යන ප්‍රදේශ සම්බන්ධ කරමින් ඉදිකර ඇති පාලම ප්‍රතිසංස්කරණය කළ යුතු බවත්;

(ii) එම පාලමෙන් ප්‍රවාහන පහසුකම් සලසා ගැනීම ජනතාවට දැඩි දුෂ්කර කාර්යයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත පාලම ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

597/2025

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් හදිසි සහතික (EC passport) නිකුත් කිරීම 2024.12.24 දිනෙන් පසුව නවතා ඇති බව දන්නේද;

(ii) ඒ සඳහා හේතුවූ කරුණු කවරේද;

(iii) ඉන්දියාවේ සහ නේපාලයේ වන්දනා ගමන් සඳහා පිටත්ව යන වන්දනාකරුවන් සඳහා සහ විවිධ රෝගවලට ඉන්දියාවෙන් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට පිටත්ව යන රෝගීන් සඳහා ඒ වෙනුවට ලබාදී ඇති විකල්පය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

622/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වාර්තා වූ ආපදා සිද්ධීන් සංඛ්‍යාව, එම සිද්ධීන්වලදී ආපදාවන්ට ලක් වූ පුද්ගලයන් සංඛ්‍යාව සහ එම පුද්ගලයන්ට ගෙවන ලද වන්දි මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා ආපදා කළමනාකරණය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) ලෝකයේ බොහෝ රටවල් ආපදා කළමනාකරණය සඳහා සුවිශේෂ අවධානයක් යොමු කරන බව දන්නේද;

(iv) ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

726/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙරටට වර්ෂයකට ආනයනය කරනු ලබන අර්තාපල් අල ප්‍රමාණය කොපමණද;

(ii) ආනයනය කරනු ලබන අර්තාපල් අල සඳහා අය කරනු ලබන බද්ද කොපමණද;

(iii) මේ දිනවල නුවරඑළිය, වැලිමඩ, ඌව පරණගම සහ හපුතලේ යන ප්‍රදේශවල අර්තාපල් අල අස්වැන්න නෙලන බව දන්නේද;

(iv) එබැවින් ශ්‍රී ලංකාවේ අර්තාපල් අල අස්වැන්න නෙලන කාල වකවානුවේදී ශ්‍රී ලංකාවට අර්තාපල් අල ආනයනය නතර කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1122/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ත්‍රිවිධ හමුදාවේ සේවය කරනු ලබන සිවිල් සේවකයන් සහ සේවිකාවන් සංඛ්‍යාව යුධ, ගුවන් සහ නාවික අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන් නියැලී සිටින වෘත්තීන් කවරේද;

(iii) ඔවුන් අතරින් සේවය ස්ථිර කර ඇති සිවිල් සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) තාවකාලික පදනම මත මේ වනවිට සේවය කරනු ලබන සිවිල් සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(v) තාවකාලික පදනම මත සේවය කරන ලද සිවිල් සේවකයන් අවසන් වතාවට ස්ථිර කරන ලද වර්ෂය කවරේද;

(vi) තාවකාලික පදනම මත මේ වනවිට සේවය කරනු ලබන සිවිල් සේවකයන් ස්ථිර කිරීමට කටයුතු කරන්නේද;

(vii) එසේ නම්, ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(viii) තාවකාලික පදනම මත සේවය කරනු ලබන සිවිල් සේවකයන් ස්ථිර කිරීමට අදාළ ක්‍රියාපටිපාටිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ත්‍රිවිධ හමුදාවල සිවිල් සේවක පුරප්පාඩු තිබේද;

(ii) එම පුරප්පාඩු පිරවීම සඳහා සකස් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 සැප්තැම්බර් 12 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

638/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ලංකා ධීවර සංස්ථාව ධීවරයන්ගෙන් මිලදී ගන්නා ලද මාළු ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මාළු ප්‍රමාණය ශ්‍රී ලංකාවේ මුලු මාළු අස්වැන්නේ ප්‍රතිශතයක් ලෙස එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මාළු මිලදී ගැනීම සඳහා සහ මාළු මිල ස්ථාවර මට්ටමක පවත්වා ගෙන යාම සඳහා ලංකා ධීවර සංස්ථාවේ මැදිහත්වීම කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(iv) එසේ නම්, එම තත්ත්වය නිවැරදි කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

736/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) E-වීසා ක්‍රමය සම්බන්ධයෙන්වූ වංචා සොයා බැලීම සඳහා වෝහාරික විගණනයක් සිදු කිරීමට එකඟවූ දිනය කවරේද;

(ii) එම වෝහාරික විගණනය සිදු කර තිබේ නම්, ඒ තුළින් අනාවරණයවූ කරුණු කවරේද;

(iii) ඉහත වංචා සම්බන්ධයෙන් නීතිය දැඩිව ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

809/2025

ගරු මුජිබුර් රහුමාන් මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය ස්ථාපිත කිරීමේ අරමුණු කවරේද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා එම අධිකාරිය සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම අධිකාරියේ කාර්යයන් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

833/2025

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමූපකාර ග්‍රාමීය බැංකු සම්බන්ධයෙන් මධ්‍යම රජයේ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට සහ පළාත් සභා සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවලට පැවරී ඇති කාර්යභාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) සමූපකාර ග්‍රාමීය බැංකු විගණනය කිරීම, එම දෙපාර්තමේන්තුවලට පැවරී ඇති බව දන්නේද;

(iii) එසේ නම්, 2015 වර්ෂයේ සිට මේ දක්වා මධ්‍යම රජයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සහ පළාත් සභා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු විසින් විගණනය කරන ලද සමුපකාර ග්‍රාමීය බැංකු සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) සමුපකාර ග්‍රාමීය බැංකු නිසි පරිදි විගණනය නොකිරීම හේතුවෙන් එම බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩල විසින් මහා පරිමාණ මූල්‍ය වංචා සිදු කර තිබෙන බව දන්නේද;

(v) එසේ නම්, එම තත්ත්වය වැළැක්වීම සඳහා සමුපකාර ග්‍රාමීය බැංකු නිසි පරිදි වාර්ෂිකව විගණනය කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

860/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර ඇති ආර්ථික මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා අතරින් ක්‍රියාත්මක තත්ත්වයේ පවතින සහ අක්‍රිය තත්ත්වයේ පවතින ආර්ථික මධ්‍යස්ථාන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මැදවච්චිය ආර්ථික මධ්‍යස්ථානයක් තිබෙන බව දන්නේද;

(iv) එම ආර්ථික මධ්‍යස්ථානය විවෘත කරන ලද දිනය කවරේද;

(v) එය ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(vi) එහි ඇති වෙළඳ කුටි සංඛ්‍යාව කොපමණද;

(vii) ඒ අතරින් මේ වනවිට ව්‍යාපාර කටයුතු සඳහා විවෘතව පවතින වෙළඳ කුටි සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

870/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික තරුණ සේවා සභාව ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එය ආරම්භ කිරීමේ අරමුණ කවරේද;

(iii) එම සභාව යටතේ ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ආයතන කවරේද;

(v) ජාතික තරුණ සේවා සභාව යටතේ ඇති පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(vi) එම පුහුණු මධ්‍යස්ථාන මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2020 සිට 2024 දක්වා ජාතික තරුණ සේවා සභාවට අයත් ආයතනවල අලුතින් ඉදිකිරීම් ආරම්භ කරන ලද ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගොඩනැගිලි අතරින් සමහර ගොඩනැගිලිවල මේ වනතෙක් වැඩ අවසන් කර නොමැති බව දන්නේද;

(iii) එසේ නම්, එම ගොඩනැගිලි සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

879/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් නොමැති පුද්ගලයන් විසින් ඉඩම් ලබා ගැනීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වා වූ කාලසීමාවේදී මන්මුනෛපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට දීමනා ඔප්පු (Deed of Grant) හෝ ඉඩම් බලපත්‍ර (Land permit) ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මන්මුනෛපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පදිංචි වී ඇති පුද්ගලයන්ගෙන් බහුතරයකට මේ දක්වා දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබා දී නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට මේ දක්වා ඉඩම් ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබා නොදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

901/2025

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් සිටින්නේද;

(iii) ඒවාට අවශ්‍ය ඉංජිනේරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම සංඛ්‍යාව සිටින්නේද;

(v) නොඑසේ නම්, ඉංජිනේරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(vi) නව ඉංජිනේරුවන් බඳවා ගන්නේද;

(vii) එසේ නම්, ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විදුලිය උත්පාදනය කරන ප්‍රභවයන් කවරේද;

(ii) එම එක් එක් ප්‍රභවයෙන් මේ වනවිට උත්පාදනය කරන ඒකක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලය පුද්ගලීකරණය කරන්නේද;

(iv) එසේ නම්, එහි සේවකයන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මණ්ඩලය යටතේ පවතින සමාගම්වල මේ වනවිට ආරම්භ කර ඇති උපාය මාර්ගික වැඩසටහන්/ව්‍යාපෘති කවරේද;

(ii) ඉහත එක් එක් සමාගමේ මේ වනවිට සේවය කරන සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සමාගම්වල අතිරික්ත සේවකයන් සිටින්නේද;

(iv) එසේ නම්, අතිරික්ත සේවකයන් සංඛ්‍යාව එක් එක් සමාගම අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ලංකා විදුලිබල සමාගම මඟින් ආවරණය කරන ප්‍රදේශ කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

995/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ආහාර බෝග නිෂ්පාදනයේ යෙදී සිටින ගොවියාගේ ජීවන තත්ත්වය උසස් කළ යුතු බවත්;

(ii) ඒ සඳහා, ගොවීන් විසින් විශාල ශ්‍රමයක් සහ මුදලක් යෙදවිය යුතු බවත්;

(iii) එසේ වුවද, කෘෂි නිෂ්පාදන සඳහා ශ්‍රමයට සහ වියදමට සරිලන සාධාරණ මිලක් නොලැබීමෙන් ගොවීන් පීඩාවට පත් වී සිටින බවත්;

(iv) කෘෂි නිෂ්පාදන මිලදී ගැනීමේදී, පාරිභෝගිකයාටද ඉහළ මිලක් ගෙවීමට සිදුවී ඇති බවත්;

(v) ගොවියා සහ පාරිභෝගිකයා අතරමැද සිටින තොග වෙළෙන්දා සහ සිල්ලර වෙළෙන්දා විසින් අධික ලාභ ලබන බවත්;

(vi) ගොවියා සහ පාරිභෝගිකයා යන දෙදෙනාම පීඩාවට පත් කරන ඉහත ක්‍රමය වෙනස් කළ යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, ගොවියා, වෙළෙන්දා සහ පාරිභෝගිකයා යන තිදෙනාම ආරක්ෂා වන ආකාරයේ වැඩපිළිවෙළක් මේ සඳහා සකස් කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1047/2025

ගරු අජිත් ගිහාන් මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැළණිය, වනවාසල කසල ව්‍යාපෘතිය වර්ෂ කිහිපයක සිට අතරමග නතර කර තිබෙන බව දන්නේද;

(ii) පුත්තලම දිස්ත්‍රික්කයේ, අරුවක්කාඩුව කසළ අංගනය අසාර්ථක වීමට බලපාන ලද හේතු කවරේද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(iv) එම ව්‍යාපෘතිය අසාර්ථක වීම සඳහා දේශපාලන බලපෑමක් හේතුවී තිබේද;

(v) එම ව්‍යාපෘතියේ වැඩ අවසන් කර, එය නැවත ආරම්භ කිරීම සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?